# රතු ඉන්දියානු ජාතික සියැටල්ගේ පාරිසරික ප්‍රකාශ, එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය හරහා ශ්‍රී ලංකාවේ නීති සම්පාදනයට බලපාන අයුරු

**කිෂානි හෙට්ටිආරච්චි**

**සංවර්ධන නිලධාරි, දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය**




රතු ඉන්දියානු නායකයෙකු වුණු සියැටල් උපත ලද්දේ 1788 වර්ෂයේ පූගට් සවුන්ඩ් ප්‍රදේශය අසල පිහිටි දූපතක් වන බේන්බ්‍රිජ් දිවයිනේය. ඔහුගේ පියා ස්ක්වේමේ ස්කුවාමිල් නම් විය. ඔහු ද ගෝත්‍රිය නායකයකු විය. මව නමින් ස්කොලට්සා දුවාමීෂ් වුණු අතර ඇය ගෝත්‍රික නායකයකුගේ දියණියක් වූවාය. සියැටල් ගේ නියම නම වුණේ සීත්ල් ය. එය ඉංග්‍රීසි උච්චාරණයට අනුව සියැටල් නම් විය. තරුණ කාලයේදීම යුද විරුවකු වුණු සියැටල් ගෝත්‍ර හයකටම නායකයා වූයේය. වසර 78 ක් ජීවත් වුණු නායක සියැටල් 1866 දී පූගට් සවුන්ඩ්හි දී අභාවප්‍රාප්ත විය. එහෙත් ඔහු අද ද අමරණීය චරිතයක් වී ඇත.

"අපි ඔබලාට වඩා වෙනස් වූවන්ය. ඔබගේ නගර වල දසුන් රතු මිනිසාගේ දෑස් වලට ගෙන දෙන්නේ වේදනාවකි. රතු මිනිසා ම්ලේච්ඡයකු වීම නිසා මේවා අපට නොවැටහෙනවා වන්නට ඇත. සුදු මිනිසාගේ නගර වල නිසංසල තැනක් සොයා ගන්නට නැත. කෘමීන්ගේ පියාපත් වල සර සරයත්, වසන්තයේදී ගහ කොළ දලු ලන ශබ්දයවත් අසන්නට එහි තැනක් නැත. මම ම්ලේච්ඡයකු වන නිසා මට මේ ගැන අවබෝධයක් නැතුවා වෙන්නටත් ඇත. නගරයේ ඇත්තේ කර්ණ කඨෝර ශබ්දය පමණි. උලමාගේ හඬ නැගීමත් රාත්‍රියේදී පොකුණු වල සිටින්නාවූ මැඩියන්ගේ බක බකයත් අසන්නට නැති ජීවිතයෙන් ඇති එල කුමක් ද? මම රතු මිනිසෙක්මි. ඒ නිසා මට මේවා නොතේරෙනවා වන්නට ඇත. ඉන්දියානුවන් වන අපි විල් පොකුණු මතින් හමා යන සිහිල් සුළගේ හඬටත්, දහවලේ වූ හිරි පොදයෙන් පවිත්‍ර වුණු පවන් රොද දේවදාර තුරු මුදුන් මතින් එහි සුවඳත් කැටුව හමා ඒමත් අත් විඳින්නට කැමැති වූවෝ වෙමු. රතු මිනිසාට වාතය ඉතා වටනේය. ගහ කොළ, සතා සීපාවා, මිනිසා මේ හැම දෙනාම බෙදා ගන්නේ එකම පිවිතුරු වායුවයි. සුදු මිනිසුන් වන ඔබ තමන් ආශ්වාස කරන වාතය ගැනවත් නොතකයි. සුළගේ වූ සුගන්ධවත් බවවත් නොදන්නා ඔවුහු මළගිය වුන් මෙන් හැසිරෙති. අපේ භූමිය ඔබට විකිණුවහොත් මේ සුළඟ අපට බෙහෙවින් අගනා දෙයක් වූ බව සිහි තබා ගන්න. අපේ මුතුන් මිත්තන්ට ජීවන හුස්ම ලබා දුන් මේ මද නල අතරමයි ඔවුන්ගේ අවසන් හුස්ම පොදත් සැඟව ගියේ. අපේ දරුවන්ට ජීවන හුස්ම සැපයිය යුත්තේ ද මේ මදනලමය. අප ඔබට මේ භූමිය විකිණුවොත් එය ශුද්ධ වස්තුවක් ලෙස ආරක්ෂා කර ගනු මැනවි. ලා තණ තිල්ලේ ඇති මල් වල හැප්පී එන මදනලෙහි සුගන්ධවත් සුවඳ විඳගන්නට සුදු මිනිසුන් වන ඔබටත් එවිට හැකියාව ලැබේවි. අපගේ ඉඩම් මිලදී ගැනීම කෙරේ ඔබ ඒවා තිබූ යෝජනාව ගැන අපි සළකා බලන්නෙමු. ඔබගේ ඒ යෝජනාව අප පිළිගනු ලැබුවහොත් මම එක් කොන්දේසියක් පනවන්නෙමි. මේ භූමියේ ජීවත් වන්නා වූ සත්වයන්ට තමන්ගේ සහෝදරයන්ට මෙන් සළකන්නට සුදු මිනිසා පොරොන්දු විය යුතුය.

මුළු ලෝකයේම ජනතාව පරිසරය සම්බන්ධයෙන් අවදිකරන්නට හේතුවූ සියැටල්ගේ මෙම ප්‍රකාශයෙන් පසු ක්‍රමයෙන් ආර්ථික හා සමාජීය සංවර්ධනයත් සමගම යායුතු තවත් පැතිකඩවල් බොහොමයක් ඇති බව සියලූදෙනාටම ප්‍රත්‍යක්ෂ විය.

එසේම සම්මුතියෙහි සඳහන් ප්‍රතිපත්ති මාලාව ගත්විට ඒ ඒ පාර්ශවකාර රාජ්‍යයන් විසින් තම රටට ගැලපෙන ලෙස අනුගත කරගතයුතු හා නීතිගත කරගතයුතු ප්‍රතිපත්ති සමුහයක් ලෙස තෙවන වගන්තියෙහි දක්වා ඇත. සම්මුතියෙහි අරමුණු හා ගිවිසුමට ඇතුලත් නියෝග ක්‍රියාත්මක කිරීමෙහිලා අනෙකුත් කරුණු අතර පහත දැක්වෙන කරුණු මගින් පාර්ශවයක් අතර අන්තර් මෙහෙයුමක් සිදුකෙරේ.

1. පොදු මෙන්ම විවිධවූ වගකීම් හා එවැනි කුසලතාවලට අනුකුලව හා සාධාරණත්වය පදනම් කරගත් මානව වර්ගයාගේ වත්මන් හා අනාගත පරපුරේ ප්‍රයෝජනය වෙනුවෙන් සියලූ පාර්ශවයන් විසින් දේශගුණික පද්ධතිය ආරක්ෂා කරගත යුතුය. එලෙසම සංවර්ධිත රටවල පාර්ශවයන් විසින් දේශගුණ විපර්යාසයන්ට හා එහි අහිසි බලපෑම් වෙනුවෙන් සටන් කිරීමට පෙරමුණ ගත යුතුය.

2. දියුණු රටවල පාර්ශවයන්ගේ විශේෂිත අවශ්‍යතා සහ විශේෂිත තත්ත්වයන් ප්‍රධාන වශයෙන් දේශගුණික විපර්යාසයන්හි අහිසි විපාකයන්ට ගොදුරුවන සහ එම රටවල එනම් ප්‍රධානකොට සංවර්ධනය වෙමින් පවත්නා රටවල පාර්ශවයන්ගේ අභිමතානුකුල නොවන හෝ පොදු සම්මුතිය මත අසාමාන්‍ය බරක් ඉසිලීමට සිදුවීම වෙනුවෙන් පූර්ණ සලකා බැලීමක් සිදුකෙරේ.

3. දේශගුණ විපර්යාසයන් බලාපොරොත්තුවීමට, අවමකිරීමට හා වැලක්වීමට සහ එම අහිසි ප්‍රතිඵල ලිහිල් කරලීම සඳහා සියලූ පාර්ශ්වයන් ක්‍රියාමාර්ග ගතයුතු වේ. දරුණු මෙන්ම නැවත සමානත්වයට පත්කළ නොහැකි විනාශයන් පිළිබඳ අවධානමක් ඇති ස්ථානවල එවැනි ක්‍රියාමාර්ග පසුවට කලයුතු වන්නේ පූර්ණාත්මක සත්‍යයක් මත පිහිටාගෙනය. දේශගුණික විපර්යාසයන් සමග බැඳෙන මෙම ප්‍රතිපත්ති ගෝලීය ප්‍රතිලාභ සඳහා අවම වියදමකින් කළයුතු පිරිවැය ඵලදායි ඒවා වියයුතුවේ. මෙම තත්ත්වයන් සාර්ථක කරගැනීමටනම් හරිතාගාර වායුවල සියලූ මූලයන්, ජලාශයන්, ප්‍රභවයන් හා අනුවර්තනයන්ද සමාජ ආර්ථික සන්ධර්භයන්ද සරවග්‍රාහී ලෙසින් සැලකිල්ලට ගතයුතු වේ. දේශගුණ විපර්යාසයන් ගැන හඳුන්වාදීම සාමුහික ලෙස මේ ගැන උනන්දුවක් දක්වන පාර්ශවයන් විසින් කලයුතු වේ.

4. පරිසර සමතුලිතතාවය ආරක්ෂා කරන්නාවූ සන්ධානයක් සඳහා උනන්දු කරවීම පාර්ශවයන් විසින් කල යුතු අතර එසේ කිරීමට අයිතියද ඇත. දේශගුණික පද්ධතිය මානව බලපෑම් විකෘතිවීම් වලින් ආරක්ෂා කිරීමේ ක්‍රියාමාර්ග හා ප්‍රතිපත්ති එක් එක් පාර්ශවයේ විශේෂ ක්‍රමවේදයන්ට අනුකුල වියයුතු අතර ජාතික සංවර්ධන ක්‍රියාදාමයන් සමග සම්බන්ධ විය යුතුවේ. මෙය සිදුවිය යුත්තේ එම සංවර්ධන ක්‍රියාදාමයන් අත්‍යාවශ්‍යයෙන්ම දේශගුණ විපර්යාසයන්ට අනුගත විය යුතුය යන්න සලකාගෙනය.

5. සම්පත් ක්ෂයවීම වලක්වන ආර්ථික සංවර්ධනයක් කරා යොමුවන විවෘත අන්තර්ජාතික ආර්ථික ක්‍රමයකට පාර්ශවයන්ගේ සහයෝගය ලබාගත යුතුය. දේශගුණ විපර්යාසයන් නිසා මතුවන ගැටළු හොඳින් ඉදිරිපත් කිරීමට, සංවර්ධනය වෙමින් පවත්නා රටවල පාර්ශවයන්ට මේ මගින් හැකිවනු ඇත. දේශගුණික විපර්යාසයන් නිසා මතුවන ගැටළු හොඳින් ඉදිරිපත් කිරීමට, සංවර්ධනය වෙමින් පවත්නා රටවල පාර්ශවයන්ට මෙමගින් හැකිවනු ඇත. දේශගුණික විපර්යාසයන්ට එරෙහිව ඒක පාර්ශවිකව වුවද කටයුතු කිරීමේදී අසාධාරණ හේතුන් මත ඇතිකරනු ලබන ජාතිබේද හෝ අන්තර්ජාතික වෙළදාමේ වක්‍ර සම්බන්ධතා ආරවුල් සහ අත්තනෝමතික මැදිහත්වීමක් හෝ සිදු නොවිය යුතුය.

එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියෙහි සඳහන් වගන්ති අනුව සැකසුනු ශ්‍රී ලංකාවේ දේශගුණ විපර්යාස පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සලකා බැලූවිට එහි පූර්විකාවෙහි මෙසේ සඳහන් වේ. "ගෝලීය උණුසුම්වීම හේතුවෙන් ඇතිවී ඇති දේශගුණ විපර්යාස විසි එක් වන සියවසේ ප්‍රධාන මානව සංවර්ධන අභියෝගය ලෙස සමස්ත ලෝක වාසීන් විසින් හඳුනාගෙන ඇත. දේශගුණ විපර්යාස සිදුවෙමින් පවතින බවත්, ගෝලීය උණුසුම්වීම මානව ක්‍රියාකාරකම්

හේතුකොට ගෙන හරිතාගාර වායු ඉතා අධික ලෙස වායුගෝලයට මුදාහැරීමේ සෘජු ප්‍රතිඵලයක් බවත්, දේශගුණ විපර්යාස පිළිබඳ අන්තර්රාජ්‍ය මණ්ඩලය (IPCC) මගින් තහවුරු කර ඇත. ඒ අනුව, නිශ්චිතවම වර්තමාන හා අනාගත පරම්පරාවට දේශගුණ විපර්යාස බලපෑම් හමුවේ, සියලු ජාතීන් අවධානමට ලක්ව ඇති අතර, විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවත්නා රටවලට ඒ සඳහා අනුවර්තනය වීමට ඇති අඩු හැකියාව නිසා එම රටවල් දැඩි අවධානමට ලක් ව ඇත.

මෙම දේශගුණ විපර්යාස ප්‍රතිපත්තිය "ඉදිරි දැක්ම", "මෙහෙවර", "ඉලක්කය" සහ "නියමු මූලධර්ම" පදනම් කරගත් පුළුල් ප්‍රතිපත්ති ප්‍රකාශණ සහිතව සකස් කර ඇත. එම ප්‍රතිපත්ති "ප්‍රකාශණ දේශගුණ විපර්යාස වල අහිතකර බලපෑම නිසා ඇතිවන අවදානම, දේශගුණ විපර්යාස වල අහිතකර බලපෑම් අවම කිරීම සඳහා අනුවර්තනය, හරිතාගාර වායු විමෝචනය අවම කිරීම, තිරසාර පරිභෝජනය හා නිෂ්පාදනය, දැනුම් කළමනාකරණය සහ පොදු ප්‍රකාශණ යටතේ ගොනුකොට ඇත. මෙම ප්‍රතිපත්ති ප්‍රකාශ අර්ථවත් ලෙස ක්‍රියාත්මක කර දේශගුණ විපර්යාස අභියෝග ජයගැනීම සඳහා සෑම සියලු දෙනාම එක්ව සහයෝගීව ක්‍රියාමාර්ග අනුගමනය කිරීම අත්‍යාවශ්‍ය වේ.

සංවර්ධනය වෙමින් පවත්නා නිවර්තන කලාපීය දිවයිනක් වන ශ්‍රී ලංකාවද, දේශගුණ විපර්යාස වල දැඩි බලපෑමට ලක්වී ඇත. අධික තීව්‍රතාවකින් යුත් වර්ෂාපතනයකින් පසුව ඇතිවන හදිසි ජල ගැලීම් හා නායයාම්ද දීර්ඝ වියළි කාලගුණ තත්ත්ව හේතුකොට ගෙන ඇතිවන ජල හිගය ආදී අන්තගාමී කාලගුණ තත්ත්වද ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජීය ක්‍රියාකාරකම් අවුල් ජාලයක් බවට පත්කිරීමට පොසිල ඉන්ධන දහනය මෙයට වැඩි වශයෙන් දායක වේ. එමනිසා, අහිතකර දේශගුණ විපර්යාස වලට මුහුණදීමට හැකිවන පරිදි රට තුල දේශගුණ විපර්යාස අනුවර්තන ක්‍රියාමාර්ග ගැනීම ඉක්මන් හා අත්‍යාවශ්‍ය කාර්යයකි. අනුවර්තන ක්‍රියාමාර්ග කෙරෙහි ප්‍රමුඛතාව ලබාදෙමින්, ශ්‍රී ලංකාව තිරසාර සංවර්ධන රාමුව තුල සහ සන්ධානයෙන් සම්මත වූ මූලධර්මයන්ට අනුකූලව හරිතාගාර වායු විමෝචනය අවම කිරීමේ ගෝලීය ප්‍රයත්නයට සක්‍රීයව දායකවෙමින් සිටී.

ශ්‍රී ලංකාව වැනි දූපත් රාජ්‍යයන් කෙරෙහි දේශගුණ විපර්යාස සෘජු බලපෑමක් ඇති කරයි. ශ්‍රී ලංකාවේ විශේෂයෙන්ම බස්නාහිර, දකුණු හා වයඹ වැනි ඉහළ ජනගහනයක් සහිත නාගරික වෙරළාශ්‍රිත කලාපයට වර්ෂාපතනය වැඩිවීම හා මුහුදු මට්ටම ඉහළ යාම වැනි දේශගුණ විපර්යාස තත්වයන්ගේ සෘජු බලපෑමක් එල්ල විය හැකිය. මේ වන විට ශ්‍රී ලංකාව නියගය, අධික වැස්සෙන් පසු ඇතිවන හදිසි ජල ගැලීම් ආදී ආන්තික කාලගුණික තත්වයන්ට වැඩි වශයෙන් මුහුණ දෙමින් සිටින අතර කාලගුණ වාර්තාවන්ට අනුව අපගේ වාර්ෂික වර්ෂාපතන රටාව පසුගිය දසවස් කිහිපයක සිට වෙනස් වී ඇත. මේ නිසා, කොළඹ නගරය වැනි අතිශය නාගරීකරණය වූ ප්‍රදේශ නිතර ජල ගැලීම් වලට ලක්වෙමින් පවතී. ජීවනෝපාය හා දේපළ බොහෝ අනතුරට ලක්කරමින් නායයෑම් සිදුවෙමින් පවතී. දේශගුණ විපර්යාස කෘෂිකර්මාන්තය, සංචාරක ව්‍යාපාරය, ධීවර, මානව ජනාවාස, පොදු පහසුකම්, ජල සැපයුම, සෞඛ්‍යය ආදී වෙනත් බොහෝ අංශ කෙරෙහිද බලපා ඇති බවට සාධක ඉදිරිපත් වී ඇත.




ආන්ත්‍රික කාලගුණික තත්වයන් නිසා බෝග අස්වැන්න අඩුවීම, අස්වැන්න රටාවේ වෙනස්කම් ඇතිවීම, ද්‍රව කලාපීය ග්ලැසියර දියවීම හා දියවැල් ප්‍රසාරණය නිසා මුහුදු මට්ටම ඉහළ යාම, සංචාරක කර්මාන්තයට ඇතිවිය හැකි බලපෑම, උෂ්ණත්වය වෙනස්වීම නිසා මත්ස්‍යය ගහණය ක්ෂය වීම, මානව ජනාවාස කෙරෙහි බලපෑම් ඇතිකරමින් පහත් බිම් ජලයෙන් යටවීම, ගංගා පද්ධතියට කරදිය ඇතුළුවීම නිසා ජල සම්පාදන ක්‍රම කෙරෙහි අයහපත් බලපෑම් ඇතිවීම,

මැලේරියා, ඩෙංගු වාහකයන් මගින් බෝවිය හැකි රෝග ව්‍යාප්තිය ආදිය දේශගුණ විපර්යාස හේතුවෙන් ඇතිවිය හැකි අයහපත් බලපෑම් අතර වේ. ක්ෂයවන පාරිසරික අවකාශයක් තුල, යහපත් සහ ගුණාත්මක ජීවිතයක් ලබාදීම සඳහා තම ආර්ථිකයන් දියුණු කිරීම වර්තමානයේ දී සංවර්ධනය

වෙමින් පවත්නා රටවල් මුහුණපාන ප්‍රබල අභියෝගයන් හට මුහණ දීමට සිදුවී ඇත්තේ ගෝලීය තත්ත්වයන් හා බැඳී පවතින යටිතල පහසුකම් දියුණු කිරීමට ලබාදෙන මූල්‍යමය ආධාර අඩුකිරීමේ ප්‍රවනතාව, බලශක්ති වෙළඳපොලෙහි අස්ථාවර බව මෙන්ම ආහාර සුරක්ෂිතතාව, වෙළඳ, වාණිජ හා කර්මාන්ත සංවර්ධන ක්ෂේත්‍රයන් හා බැඳී පවතින අර්බුදකාරී තත්වයන් හට මුහුණදෙන අතරතුර දේශගුණ විපර්යාස හේතුවෙන් පැනනගින පාරිසරික ගැටළුද ඊට හේතු වේ.

ශ්‍රී ලංකාවේ දැනට පවතින දේශගුණ විපර්යාසවලට අදාල නීති සලකා බැලුවිට එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය (UNFCCC) හි මුලධර්ම ඇතුලත් කොට ඇති නීති විශාල ප්‍රමාණයක් ඇති නමුත් එමගින් බලාපොරොත්තු වූ අරමුණු ඉටුවී තිබේදැයි සාධාරණ සැකයක් මතුවේ. ප්‍රධාන ලෙසම පරිසරය



සුරැකීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ වැදගත්ම පනත වන ජාතික පාරිසරික පනත වර්තමාන තත්වයන්ට ගැලපෙන ලෙස සංශෝධනය විය යුතුය. එසේම ඒ යටතේ පිහිටුවා ඇති මධ්‍යම පරිසර අධිකාරිය සතු බලතල පුළුල්කිරීම හා ක්‍රමවත් කිරීම මෙන්ම නීති කඩකරන පුද්ගලයන්ට ලැබෙන දඬුවම් පිළිබඳවද සංශෝධන හා එකතුකිරීම් කළයුතුව ඇත!

ජාතික පාරිසරික පනතට අමතරව වනසත්ව හා වෘක්ෂලතා පනත, සාගර දූෂණය වැලැක්වීමේ පනත, සමුද්‍ර සංරක්ෂණ පනත, පතල් හා ඛනිජ සම්පත් පනත, ජාතික අභයභූමි පනත, වන සංරක්ෂණ පනත, මත්ස්‍යය හා ජලජ සම්පත් පනත, පස සංරක්ෂණ පනත, ශාක සම්පත් ආරක්ෂා කිරීමේ පනත, උද්භිද උද්‍යාන පනත, නගර සංවර්ධන හා සැලසුම් පනත, වාරිමාර්ග පනත, ගංවතුර වැලැක්වීම පිළිබඳ පනත, මහවැලි අධිකාරිය පනත, ග්‍රාමීය ප්‍රජාව සම්බන්ධ පනත, වසංගත රෝග වැළක්වීමේ පනත, පලිබෝධනාශක සීමාකිරීමේ පනත, ජාතික ජලජ සම්පත් අධිකාරී පනත, ජාතික ජලජ සම්පත් සංවර්ධන හා පර්යේෂණ සම්බන්ධ පනත, ප්‍රවාහන පනත, විදුලි කටයුතු පනත, විදුලි පනත ආදී පනත් ගණනාවක

ඇත. එම එක් එක් පනත ගත්විට අප රට තුල ප්‍රමාණවත් නීති පද්ධතියක් ඇති බව බැලූ බැල්මටම පෙනෙන නමුත් එම නීති මගින් දේශගුණ විපර්යාස පිළිබඳව වූ අන්තර්ජාතික සම්මුතියෙහි දක්වා ඇති අරමුණු හා පරමාර්ථ සාක්ෂාත් කරගැනීමෙහිලා කොතෙක් දුරට ඉවහල්වී ඇත්දැයි සොයා බැලිය යුතුය.